" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 — SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/01 | |
| ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | |
| දිනය / திகதி / Date | 2024.10.09 | |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.10.03 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | අ.දූ.වෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2024 හා 2024.03.01 | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2024 හා 2024.09.06 | අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට විධිමත් අනුමැතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ඩී. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන).
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දූරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

# බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
මேல் மாகாண ஆளுநர் பணிமனை
**GOVERNOR'S OFFICE - WESTERN PROVINCE**

අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල.
இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.


ඔබේ අංකය. / உமது இல. / Your Ref. – CSWP/ADM/30-38/FI/01

මගේ අංකය / எனது இல. / My Ref. – GOS/ADM/6/2/19

දිනය / திகதி / Date – 2024.10. 03

"ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්" -" பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை " -" People Friendly Excellent Public Service "

ප්‍රධාන ලේකම් කාර්යාලය ලිපි අංකය 124230 07 OCT 2024 බස්නාහිර පළාත් සභාව

ADM-30

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2024.09.27 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| අ.දූ.වෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2024 | 2024.03.01 | 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම. |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2024 | 2024.09.06 | අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට විධිමත් අනුමැතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

**සෝමසිරි පල්ලත්තරගේ**
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංක - 0112092816
ෆැක්ස් - 0112092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk


| ආණ්ඩුකාර ලේකම් / ஆளுநரின் செயலாளர் / Secretary to the Governor | සහකාර ලේකම් I / உதவிச் செயலாளர் I / Assistant Secretary I | සහකාර ලේකම් II / உதவிச் செயலாளர் II / Assistant Secretary II | නීති නිලධාරී / சட்ட அதிகாரி / Legal Officer | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel : 011-2092816<br>Fax : 011-2092813<br>e-mail: secretary@secgov.wp.gov.lk | e-mail: ass.secretary1@secgov.wp.gov.lk | e-mail: ass.secretary2@secgov.wp.gov.lk | Tel : 011-2092819<br>e-mail: legalofficer@secgov.wp.gov.lk | e-mail: ao@secgov.wp.gov.lk | Tel : 011-2093670<br>Fax : 011-2092771<br>e-mail: governoroffice@secgov.wp.gov.lk |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2024

මගේ අංකය : EST-6/03/LEA/3237(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.09.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට විධිමත් අනුමතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

රජයේ නිලධරයන් ආයතන සංග්‍රහයේ සලසා ඇති ප්‍රතිපාදන හෝ 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන හෝ යටතේ විදේශගත වේ. මෙලෙස විදේශගත වන ඇතැම් නිලධරයන් අනුමතිය ලබා ඇති විදේශ නිවාඩු කාල සීමාව අවසානයේ නියමිත පරිදි සේවයට වාර්තා කිරීමෙන් තොරව, අනුමත නිවාඩු කාල සීමාව ඉක්මවා නැවත දිවයිනට පැමිණ සේවයට වාර්තා කිරීමේ වැඩි ප්‍රවණතාවක් වර්තමානයේ පවතී. එම තත්ත්වයට අදාළ ආයතන ප්‍රධානීන් විසින් නියමිත පරිදි තම රාජකාරි වගකීම් ඉටු නොකිරීම ද බලපා ඇති බව මෙම අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇති කරුණු අනුව නිරීක්ෂණය කරමි.

02. විධිමත් විදේශ නිවාඩු අනුමතියකින් තොරව සේවයට වාර්තා නොකරන නිලධරයෙකු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දැනටමත් පවත්නා පහත විධිවිධාන වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදය
ii. ආයතන සංග්‍රහයේ පළමු වන කාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ 7 වගන්තිය
iii. ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 37 වගන්තිය

03. විධිමත් අනුමතියකින් තොරව සේවයට වාර්තා නොකරන නිලධරයන් සම්බන්ධයෙන් ඉහත ප්‍රතිපාදන අනුව නොපමාව කටයුතු නොකිරීම හේතුවෙන්, අදාළ ආයතන තුළ විවිධ පරිපාලන ගැටලු උද්ගත වන අතර එය කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් මහජනයා වෙත ලබා දීම කෙරෙහි ඍජු බලපෑමක් එල්ල කරනු ලබයි. මෙවැනි අවස්ථා වැළැක්වීම සඳහා ඉහත සඳහන් කර ඇති විධිවිධාන මෙන්ම, පහතින් දක්වා ඇති තත්ත්වයන් පිළිබඳව ද අවධානය යොමු කර, ඉහත 02 ඡේදයෙහි සඳහන් විධිවිධාන පරිදි අප්‍රමාදව කටයුතු කළ යුතු ය.

I) කිසියම් නිශ්චිත කාලයකට අනුමත කරන ලද විදේශ නිවාඩුවක්, දීර්ඝ කරවා ගැනීමට ඉල්ලීමක් කරන්නේ නම්, ඒ සඳහා අනුමතිය දීමට ප්‍රමාණවත් කාලයක් තබා ඒ සඳහා ඉල්ලුම් කළ යුතු අතර දීර්ඝ කිරීම සඳහා අනුමතිය මුල් විදේශ නිවාඩු කාලය අවසන් වීමට පෙර ලබා ගත යුතු ය.

II) එවැනි විධිමත් විදේශ නිවාඩු දීර්ඝ කිරීමක් නොමැතිව අනුමත නිවාඩු කාල සීමාව අවසානයේ නියමිත දිනට සේවයට වාර්තා නොකරන නිලධරයන් සඳහා අදාළ බලධරයන්

විසින් තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කර නොතිබුණ ද, තනතුර අතහැර ගිය නිලධරයන් ලෙස සැලකිය යුතු ය. ඔවුන් වෙත තනතුර අතහැර යාමේ නිවේදනය කඩිනමින් නිකුත් කළ යුතු අතර නැවත සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදිය යුතු ය.

III) විදේශගතව සිට නිවාඩු දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන නිලධරයෙකුහට ඊට අනුමතිය ලබා දීම සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබේ නම් සහ එම ගැටලුව පළමු විදේශ නිවාඩු කාල සීමාව අවසන් වීමට පෙර විසඳා ගත නොහැකි බවට නිරීක්ෂණය වන්නේ නම්, අදාළ නිලධරයාට වහාම නැවත සේවයට වාර්තා කරන ලෙස දැනුම් දිය යුතු ය.

IV) නිවාඩු දීර්ඝ කිරීමක් ඉල්ලා තිබුණ ද, මුල් විදේශ නිවාඩු කාල සීමාව අවසන් වීමට පෙර නිවාඩුව දීර්ඝ කිරීම සඳහා අනුමතිය ලබා දී නොමැති නම්, අදාළ නිලධරයා වහාම සේවයට වාර්තා කළ යුතු අතර එසේ සේවයට වාර්තා නොකරන නිලධරයන් සම්බන්ධයෙන් ඉහත IIහි විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය.

04. එමෙන් ම, විධිමත් පරිදි විදේශ නිවාඩු සඳහා අනුමතිය ලබා දී ඇති කාල සීමාවෙන් ඔබ්බට විදේශගතව සිටින නිලධරයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ විධිවිධාන පරිදි ක්‍රියා කිරීම සඳහා වන වගකීම කිසියම් බලධරයෙකු විසින් පැහැර හරින ලද අවස්ථාවන්හි දී, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 1:2 වගන්තියේ විධිවිධාන අනුව, එම බලධරයා සම්බන්ධයෙන් ද විනයානුකූලව කටයුතු කළ යුතු ය.

05. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය මත නිකුත් කරනු ලැබේ.


ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk